11 වන බළඇණිය
විජයබාහු පාබල රෙජිමේන්තුව
යුද්ධ හමුදා කඳවුර
උරික්කාඩු, වැල්වැටිතුරෙයි
යාපනය
දුරකථන/ෆැක්ස්:021 - 2261935
ඊමේල් :11vir@army.lk
:hq11vir@gmail.com

11th Battalion
The Vijayabahu Infantry Regiment
Army Camp
Urikkadu, Valvettithurai
Jaffna
Tel/Fax:021 - 2261935
Email :11vir@army.lk
: hq11vir@gmail.com

11 විපාරෙ/මූල/පා/01/03/2025 ( 10 )

සියළුම කණ්ඩායම් - 11 විපාරෙ

2025 අප්‍රේල් 14 දින

**2025 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් 11 විපාරෙ අණදෙන නිලධාරි විසින් නිකුත් කරනු ලබන සුභාසිංශන පණිවුඩය**

ශ්‍රී ලාංකිකයින්ගේ අද්විතීය සංස්කෘතික මහෝත්සවය වන සිංහල හා හින්දු අලුත් අවුරුද්ද හෙවත් සූර්ය මංගල්‍යය වෙනුවෙන් අභිමානවත් 11 වන බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී වශයෙන් උදාවූ 2025 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් ඔබ සියළුදෙනා අමතා සුභාසිංශන පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

සූර්යා මීන රාශියෙන් මේශ රාශියට සංක්‍රමණය වීමත් සමග අලුත් අවුරුදු උදාව සනිටුහන් වන අතර, මෙම සංස්කෘතික මංගල්‍යයේ ප්‍රධානතම අරමුණ වන්නේ වසරක් ගෙවී නව වසරක් උදාව සනිටුහන් කිරීම හා මුලු රටම එකම මොහොතක එකම සුභ මුහුර්තියක පිහිටා ආගමික වතාවත් ඉටු කරමින් පවුලේ සියළු දෙනා එක්ව නව අවුරුදු උදාව සැමරීමයි. මෙම සුවිශේෂී අවස්ථාවේ අභිමානවත් විජයබාහු පවුලේ සියළුම සාමාජිකයින් එක් රොක්ව, එක් සිත්ව නව අවුරුදු උදාව සමරන බව අණදෙන නිලධාරී වශයෙන් මා ඉතා අභිමානයෙන් යුතුව සිහිපත් කරමි.

සමස්ථ ශ්‍රී ලාංකික ජනතාව හට සාමකාමී පරිසරයක් තුල සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සැමරීමට හැකිවූයේ සමස්ථ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සියළුම රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් යුතුව තම මාතෘ භූමිය රුදුරු ත්‍රස්ථවාදීන්ගෙන් බේරාගත් නිසා බව ඉතා අභිමානයෙන් යුතුව අප සියළුදෙනා විසින් මේ මොහොතේ සිහිපත් කල යුතු අතර, එම අමිල මෙහෙවර උදෙසා ඇප කැපවී දායකත්වය ලබාදීමේදී මාතෘ භූමියේ නිදහස වෙනුවෙන් සටන් වැද දිවි පිදූ සියළුම රණවිරුවන් ඉතා ගෞරවාදරයෙන් යුතුව මා මේ අවස්ථාවේ සිහිපත් කරන අතරම, ඔවුන් හට අජරාමර නිවන් සුව ප්‍රාර්ථනා කරමි. එමෙන්ම, ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබා රණක්ෂිතයට පත්ව සිටින සියළුම රණවිරුවන් හටද මේ අවස්ථාවේ ඉක්මන් සුවය ප්‍රාර්ථනා කර සිටිමි.

වත්මන් රජය විසින් පිරිසිදු රටක්, ලස්සන හෙටක් යන තේමාව යටතේ ආරම්භ කර ඇති (Clean Sri Lanka) වැඩසටහනට සමගාමීව ඉදිරි සැලසුම් ක්‍රියාවට නැංවීමේදී යුද්ධ හමුදා සාමාජිකයින් වශයෙන් විශේෂ වගකීමක් අප වෙත පැවරී ඇති බැවින්, ඒ සඳහාද අප විසින් දායකත්වය ලබාදිය යුතු අතර, රට තුල උද්ගතවන ආර්ථික හා අනෙකුත් අර්බුදකාරී වාතාවරණයන් මෙන්ම ස්වභාවික ව්‍යවසනයන් හමුවේ ආරක්‍ෂක අංශයන් වශයෙන් අප වෙත පැවරී ඇති කාර්යභාරය සුවිශේෂී වේ. LTTE ත්‍රස්තවාදී ග්‍රහනයෙන් මුදවා ගැනීමෙන් පසු විවිධ කණ්ඩායම් විසින් රට අස්ථාවර කිරීමට ගත් උත්සාහයන් හමුවේ, ජාතියේ මුර දේවතාවුන් වශයෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව පවතින රජයට පක්‍ෂපාතීව කටයුතු කරමින් විනයගරුක යුද්ධ හමුදා සාමාජිකයින් වශයෙන් රට තුල මෙතෙක් උද්ගතවූ සියළු බළවේගයන් සාර්ථකව සාමකාමී අයුරින් මැඩ පැවැත්වීමට හැකියාව ලැබුනු බව ඔබ වෙත සිහිපත් කිරීමට කැමැත්තෙමි. එබැවින් මෙම අභියෝගාත්මක කාලවකවානුවේ රාජකාරී කිරීමේදී යුද්ධ හමුදාව වෙත බලාත්මක නෛතික වටපිටාව පිළිබඳ ඔබගේ අවධානය යොමු කරන ලෙසත්, මේ වන විට විවිධ කණ්ඩායම් විසින් යුද්ධ හමුදා සාමාජිකයින් විවිධ වූ විනය විරෝධී ක්‍රියාවන්ට පොළඹවා ගැනීමට දරණ උත්සාහයන් පිළිබඳව මැනවින් අවබෝධ කර ගනිමින් රටේත් එහි වාසය කරන ජනතාවගේත් ආරක්‍ෂකයා වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත පැවරෙන වගකීම් හා අභියෝගයන් සාර්ථකව ජයගැනීම සඳහා අප නිරන්තරයෙන් බැඳී සිටින බව සිහි තබා ගත යුතුයි.

එසේම යුද්ධ හමුදාවේ කීර්තිනාමය හා ගෞරවය ආරක්ෂා කර ගනිමින් ඔබට පැවරෙන රාජකාරීන් විනයගරුකව හා වගකීමෙන් යුතුව නොපිරිහෙලා ඉටුකරන ලෙස විජයබා මාතාවගේ හා සමස්ථ යුද්ධ හමුදාවේ ගෞරවය නිසි පරිදි ආරක්ෂා කිරීම ඔබ සියළු දෙනා සතු වගකීමක් බව මා මේ අවස්ථාවේ පෙන්වා දෙමි.

මාතෘ භූමිය බේරා ගැනීම වෙනුවෙන් දිවි හිමියෙන් සටන් වැද ජීවිතය අහිමි වූ සියළුම වීරෝධාර රණවිරුවන්ගේ දෙමව්පියන් මෙන්ම බිරින්දෑවරුන් සහ දුවා දරුවන් මේ මොහොතේ ඉතා ගෞරව පූර්වකව සිහිපත් කරනු ලබන අතර, ඔවුන් හටද ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සියළු සිතුම් පැතුම් ඉටුවන වාසනාවන්ත සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමි.

තවද මෙම බළඇණියේ සේවය කර දැනට විශ්‍රාම ගොස් සිටින සියළුම නිලධාරීන් සහ සෙසු නිලයින්ටත් ඔවුන්ගේ පවුල්වල සියළු දෙනාටත් ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සියළු සිතුම් පැතුම් ඉටුවන වාසනාවන්ත සුභ අළුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමි.

අවසන් වශයෙන් ලබන්නා වූ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද මෙම ඒකකයේ රාජකාරී කරනු ලබන සියළුම නිලධාරීන් සහ සෙසු නිලයින්ටත් ඔවුන්ගේ පවුල්වල සියළුම දෙනාටත් සිවිල් සේවක මහතුන් හා ඔවුන්ගේ පවුල්වල සියළුම දෙනාටත් සියළු සිතුම් පැතුම් ඉටුවන වාසනාවන්ත සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමි.

ර්ජීජේපී එදිරිසිංහ යූඑස්පී විපාරෙ
ලුතිනන් කර්නල්
අණදෙන නිලධාරී

මූලස්ථානය
11 වන බළඇණිය
විජයබාහු පාබල රෙජිමේන්තුව
යුද්ධ හමුදා කඳවුර
උරික්කාඩු
වැල්වැටිතුරෙයි
යාපනය

11 විපාරෙ/මූ/පා/01/03/2025 ( 11 )

2025 අප්‍රේල් 14 දින

සියළු කණ්ඩායම් - 11 විපාරෙ

**<u>සුභාසිංශන පණිවුඩය ඉදිරිපත් කිරීම</u>**

1. 2025 සිංහල හා හින්දු අලුත් අවුරුදු උදාව නිමිත්තෙන් මෙම ඒකක අණදෙන නිලධාරී විසින් නිකුත් කරන ලද සුභාසිංශන පණිවුඩය මේ සමග ඔබ කණ්ඩායම් වෙත ඉදිරිපත් කරනු ලබන අතර, එම පණිවුඩය ඔබ කණ්ඩායම් යටතේ රාජකාරී නියුතු සියළුම අයවළුන්ගේ දැන ගැනීමට ලක් කරන ලෙස මින් දන්වා සිටිමි.

එල්ජ්ඕඑන් ද සිල්වා
කපිතන්
විධායක අධිකාරී
අණදෙන නිලධාරී වෙනුවට